(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 109. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 නොවැම්බර් 24 සඳුදා පූ. භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **කේ.ඩී. ලාල් කාන්ත මහතා,** කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **විජිත හේරත් මහතා,** විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා,** ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රොෂාන් අක්මීමන මහතා**

ගරු **අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු  අබූබකර් අතම්බාවා මහතා

ගරු  නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය

ගරු  හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු  නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා

ගරු  (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා

ගරු  ජේ.සී. අලවතුවල මහතා

ගරු  හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා

ගරු  ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

ගරු  මංජුල සුරවීර ආරච්චි මහතා

ගරු  (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු  එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා

ගරු  ගයන්ත කරුණාතිලක මහතා

ගරු  රවී කරුණානායක මහතා

ගරු  ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය

ගරු  ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු  උපුල් කිත්සිරි මහතා

ගරු  නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය

ගරු  කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු  කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු  මනෝ ගනේෂන් මහතා

ගරු  නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු  අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු  චතුර ගලප්පත්ති මහතා

ගරු  නිහාල් ගලප්පත්ති මහතා

ගරු  සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු  රුවන්තිලක ජයකොඩි මහතා

ගරු  (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු  දිලිත් ජයවීර මහතා

ගරු  නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු  නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු  මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු  රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු අසෝක සපුමල් රන්වල මහතා

ගරු තුරෙරෙරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා

ගරු කංචන වැලිපිටිය මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ෆස්මින් ෂරීෆ් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

ගරු දේවානන්ද සුරවීර මහතා

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය

ගරු මුහම්මද් ෆයිසාල් මහතා

ගරු රියාස් ෆාරුක් මහතා

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ගරු මන්ත්‍රීවරුනි,

2025 නොවැම්බර් 21 දින ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී චමින්ද විජේසිරි මහතා විසින් වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ දී මේ වනවිට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය පිළිබඳව සිදු කරන ලද ප්‍රකාශය සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සිදු කිරීමට කැමැත්තෙමි.

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සම්බන්ධව දැනට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය සකස් කර ඇත්තේ වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ දී එතෙක් අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදය හේතුවෙන් පාර්ලිමේන්තුවේ රැස්වීම් පවත්වනු ලබන සෑම දිනකම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් කිහිප දෙනෙකුට පමණක් එම ප්‍රශ්න ඇසීමේ අවස්ථාව හිමිව තිබීම හේතුවෙන් ප්‍රශ්න ඉදිරිපත් කරනු ලබන අනෙකුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට සමානව එම ප්‍රශ්න ඇසීමේ අවස්ථාව නොලැබෙන බවට නවවැනි පාර්ලිමේන්තුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසි දෙදෙනෙකු (22) විසින් එවකට ගරු කථානායකවරයා වෙත කරන ලද ලිඛිත අභියාචනයක් 2022.03.16 දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ විශේෂ අවධානයට යොමු කරවීම මඟිනි.

ඒ අනුව, 2022.03.16 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් මේ වනවිට න්‍යාය පත්‍රයට වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඇතුළත් කරනු ලබන ක්‍රමවේදය ඇතුළත් යෝජනාව ඉතා ගැඹුරින් හා දීර්ඝ වශයෙන් අධ්‍යයනය කොට එය ඒකමතිකව අනුමත කර ඇති අතර, එම ක්‍රමවේදය කිසිදු පක්ෂයක් නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරයෙකුට වැඩි අවස්ථාවක් සැලසෙන පරිදි සකස් කරන ලද ක්‍රමවේදයක් නොවන බවත්, ඒ සඳහා කිසිදු නිලධාරියෙකුගේ මැදිහත්වීමක් සිදු වී නොමැති බවත් මෙහිලා විශේෂයෙන් අවධාරණය කරමි.

වාචික ප්‍රශ්න සම්බන්ධව දැනට අනුගමනය කරනු ලබන මෙම ක්‍රමවේදයේ සාර්ථකත්වය සැලකිල්ලට ගෙන මන්ත්‍රීවරයන් විසින් ඉදිරිපත් කරනු ලබන 'පෞද්ගලික මන්ත්‍රී යෝජනා' න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමේ දී මෙම පදනමම යොදා ගන්නා ලෙසට මන්ත්‍රීවරයන් විසින් කරන ලද ඉල්ලීම සලකා බලා ඒ සඳහා ද මෙම පදනම යොදා ගැනීමට 2025.11.18 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව තීරණය කර ඇති බවත් සඳහන් කරනු කැමැත්තෙමි.

ඒ අනුව, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී චමින්ද විජේසිරි මහතා විසින් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඇතුළත් කිරීමේ දැනට පවතින ක්‍රමවේදය සම්බන්ධයෙන් සිදු කරන ලද ප්‍රකාශය හා එහිදී නිලධාරීන් විසින් පක්ෂග්‍රාහීව කටයුතු කොට ඇති බවට කරන ලද ප්‍රකාශය සාවද්‍ය මෙන්ම මුළුමනින්ම පදනම් විරහිත ප්‍රකාශයක් බව ද මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXX කොටස සහ නවවැනි කාණ්ඩයේ XVII කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(3) ව්‍යවස්ථාවේ අතුරු අනුව්‍යවස්ථාව සහ 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 6(ආ), (ඇ) සහ (ඒ), 16 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 35 වගන්තිය යටතේ රාජ්‍ය ණය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2025 ඔක්තෝබර් 24 දිනැති අංක 2459/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කර, එම නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 8 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117(2) වගන්තියේ (ඩ) සහ (ණ) ඡේද යටතේ නියෝග; සහ

(ii) 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 7 වගන්තියේ (ජ) සහ (ණ) ඡේද සහ 9 වගන්තිය සමඟ කියවිය යුතු 39 වගන්තිය යටතේ නියෝග

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) වත්තල, එඬේරමුල්ල, සම්පාය මාවත, අංක 564 දරන ස්ථානයෙහි පදිංචි ඒ.ඩී. ලීනස් මහතාගෙන් ලැබුණු 2025.10.06 දිනැති පෙත්සම;

(ii) වත්තල, එඬේරමුල්ල, පල්ලිය වත්ත, අංක 431/15 ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්.ටී.එම්. හුසේන් මහතාගෙන් ලැබුණු 2025.06.18 දිනැති පෙත්සම;

(iii) රාගම, කැන්දලියද්දපාළුව, අංක 656 දරන ස්ථානයෙහි පදිංචි පී.ආර්. සිරියාවතී මහත්මියගෙන් ලැබුණු 2025.08.18 දිනැති පෙත්සම;

(iv) වැබඩ, වැබඩ දකුණ, අංක 327/සී දරන ස්ථානයෙහි පදිංචි සමීර කුමාර ගුණසිංහ මහතාගෙන් ලැබුණු 2025.08.20 දිනැති පෙත්සම; සහ

(v) මීරිගම, වල්බෝතලේ, අංක. 102 ඒ, දරන ස්ථානයෙහි පදිංචි ජී.පී. තුසිත ප්‍රමෝද් විජයවර්ධන මහතාගෙන් ලැබුණු 2025.10.05 දිනැති පෙත්සම

ගරු හේමාලි වීරසේකර මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(2) කොස්ගොඩ, හැගල්ල, අංක 181 දරන ස්ථානයෙහි පදිංචි ඒ.එච්.ජී. ද සිල්වා මහතාගෙන් ලැබුණු 2025.09.29 දිනැති පෙත්සම ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. විසර්ජන පනත් කෙටුම්පත — (දහහතරවැනි වෙන් කළ දිනය):** කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.

(කාරක සභාවේදී)

කථානායකවරයා මූලාසනාරූඪ විය.

ශීර්ෂය 117

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ගරු එස්. එම්. මරික්කාර් මහතා ඉදිරිපත් කළ යෝජනාව,— "වැඩසටහන රුපියල් 10/- කින් අඩු කළ යුතු ය".

(පූ.භා. 11.00 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

(අ.භා. 2.13 ට ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 3.09 ට ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.03 ට ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 4.27 ට ගරු සුජීව දිසානායක මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 5.22 ට ගරු නිතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, නිෂ්ප්‍රභ විය.

**ප්‍රවාහන, මහාමාර්ග වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 18 වැනි පිටුවේ 18, 19 සහ 20 වැනි පේළි ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමට:—

"ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

| | |
|---|---|
| පුනරාවර්තන | 58,515,000,000 |
| මූලධන | 438,744,000,000" |

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 19 වැනි පිටුවේ 1, 2 සහ 3 වැනි පේළි ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමට:—

"ශීර්ෂ 117 ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා

| | | | | |
|---|---|---|---|---|
| වැඩසටහන | 01 | මෙහෙයුම් වැඩසටහන | 1,314,000,000 | 63,000,000 |
| වැඩසටහන | 02 | සංවර්ධන වැඩසටහන | 19,480,000,000 | 401,203,000,000" |

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 306

වැඩසටහන 02 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 306 වැඩසටහන 02 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 34,612,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 02 (මූලධන වියදම)

ශීර්ෂය 306 වැඩසටහන 02 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 35,538,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 307

වැඩසටහන 02 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 307 වැඩසටහන 02 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 2,891,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 02 (මූලධන වියදම)

ශීර්ෂය 307 වැඩසටහන 02 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 1,915,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 336

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 19 වැනි පිටුවේ 8 සහ 9 පේළි ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමට:—

"ශීර්ෂ 311 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

| | | | | |
|---|---|---|---|---|
| වැඩසටහන | 01 | මෙහෙයුම් වැඩසටහන | 218,000,000 | 25,000,000" |

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 21 වැනි පිටුවේ 4, 5 සහ 6 පේළි ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමට:—

"නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය

| | |
|---|---|
| පුනරාවර්තන | 2,457,000,000 |
| මූලධන | 69,903,000,000" |

"සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 123

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 21 වැනි පිටුවේ 8, 9 සහ 10 පේළි ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් අයිතමය ආදේශ කිරීමට:—

"ශීර්ෂ 123 නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යවරයා

| | | | | |
|---|---|---|---|---|
| වැඩසටහන | 01 | මෙහෙයුම් වැඩසටහන | 715,000,000 | 70,000,000 |
| වැඩසටහන | 02 | සංවර්ධන වැඩසටහන | 150,000,000 | 66,574,000,000" |

"සංශෝධනය පිළිගත යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය'' යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 309

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 309 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 201,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 309 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 12,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 02 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 309 වැඩසටහන 02 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 524,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 02 (මූලධන වියදම)

ශීර්ෂය 309 වැඩසටහන 02 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 61,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 310

වැඩසටහන 02 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 310 වැඩසටහන 02 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 227,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 02 (මූලධන වියදම)

ශීර්ෂය 310 වැඩසටහන 02 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 186,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 311

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 21 වැනි පිටුවේ 16 සහ 17 පේළි ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 332

වැඩසටහන 01 (පුනරාවර්තන වියදම)

ශීර්ෂය 332 වැඩසටහන 01 (පුනරාවර්තන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 640,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

වැඩසටහන 01 (මූලධන වියදම)

ශීර්ෂය 332 වැඩසටහන 01 (මූලධන වියදම) වෙනුවෙන් සඳහන්ව ඇති රුපියල් 3,000,000,000 මුදල, උපලේඛනයට ඇතුළත් කළ යුතු ය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ශීර්ෂය 176 සහ ශීර්ෂය 336

**වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වෙනුවෙන් වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ සංශෝධනයක්: 30 වැනි පිටුවේ 14 වැනි පේළියට ඉක්බිතිවම පහත සඳහන් අයිතම ඇතුළත් කිරීමට:—

"වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

| | |
|---|---|
| පුනරාවර්තන | 617,000,000 |
| මූලධන | 3,511,000,000 |

ශීර්ෂ 176 වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා

| | | | | |
|---|---|---|---|---|
| වැඩසටහන | 01 | මෙහෙයුම් වැඩසටහන | 414,000,000 | 19,000,000 |
| වැඩසටහන | 02 | සංවර්ධන වැඩසටහන | - | 3,420,000,000 |

ශීර්ෂ 336 වෙළඳ නාවික ලේකම් කාර්යාලය

| | | | | |
|---|---|---|---|---|
| වැඩසටහන | 02 | සංවර්ධන වැඩසටහන | 203,000,000 | 72,000,000" |

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"අයිතමය සංශෝධිතාකාරයෙන්, උපලේඛනයේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

අ.භා. 6.27 ට පාර්ලිමේන්තුවට වාර්තා කරනු පිණිස සභාපතිවරයා මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 නොවැම්බර් 25 අඟහරුවාදා.

**6. සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග:** වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 8 සහ 31 වගන්ති සමඟ කියවිය යුතු 117(2) වගන්තියේ (ඩ) සහ (ණ) ඡේද යටතේ එවකට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 06 දිනැති අංක 2422/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යටතේ නියෝග:** වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 7 වගන්තියේ (ජ) සහ (ණ) ඡේද සහ 9 වගන්තිය සමඟ කියවිය යුතු 39 වගන්තිය යටතේ එවකට ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්

සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 පෙබරවාරි 06 දිනැති අංක 2422/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.13 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. කල් තැබීම (වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් ගැටලු):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ. භා. 6.30 පසු කර තිබුයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරිය විසින් අ. භා. 7.08ට අද දින සභා සම්මතිය අනුව, පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2025 නොවැම්බර් 13 සභා සම්මතිය අනුව, 2025 නොවැම්බර් 25 අඟහරුවාදා පූ. භා. 9.00 වනතෙක් කල් ගියේ ය.